තමන්කඩුව ප්‍රාදේශීය සභාව
--------------------------------
පොළොන්නරුව දිස්ත්‍රික්කය
----------------------------------

1 මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 20 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 19 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කල මතය
--------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට තමන්කඩුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
-------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාත්මක කළ මාර්ග සතිය ව්‍යාපෘතිය වෙනුවෙන් පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු රු. 598,506 ක් ණයගැතියන් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ වියදම් වෙනුවෙන් 2018 වර්ෂයේ අවස්ථා 09 කදී දරා තිබුණු එකතුව රු. 48,846 ක් උපචිත වියදම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී නිරවුල් කර තිබුණු රු. 257,130 ක මුදල් ණයහිමියෝ තවදුරටත් ණයහිමි ශේෂය තුල ඇතුලත් කර තිබීම නිසා 2017 දෙසැම්බර් 31 දිනට ණයහිමියෝ එම වටිනාකමෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිග හිටි ජල ගාස්තු ආදායම රු. 300,188 ක් වුවද, එය රු. 340,016 ක් ලෙස දක්වා තිබීම නිසා ණයගැතියෝ රු. 39,828 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ මිලදී ගෙන තිබුණු ස්පීකර් 04 ක් හා රු. 39,677 ක් වූ කසල හැලුම් යන්ත්‍රයක් ප්‍රාග්ධනික කර නොතිබුණි.

(ඊ) සභාවට ලැබී තිබුණු රු. 24,871 ක එක්වන් මුදල් 2017 දෙසැම්බර් 31 දිනට හිඟහිටි ලෙස දක්වා තිබීම නිසා ණයගැතියෝ එම වටිනාකමෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(උ) 1994 අංක 07 දරන උතුරු මැද පළාත් අධිකරණ දඩ හැරවීමේ ප්‍රඥප්තිය ප්‍රකාරව 2017 ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා කාලයට අදාලව සභාවට ලැබිය යුතු උසාවි දඩ හා 2017 අගෝස්තු සිට දෙසැම්බර් දක්වා කාලයට අදාලව ලැබිය යුතු මුද්දර ගාස්තු හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.

(ඌ) කර්ටන් රෙදි, ප්ලාස්ටික් පුටු, ප්ලාස්ටික් කසල බඳුන් ඇතුළු රු. 743,316 ක් වටිනා විෂයයන් 56 ක් යන්ත්‍ර උපකරණ ලෙස මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර තිබුණි.

(එ) සභාවට අයත් ඉඩම් හා ගොඩනැගිලි ඒකක 19 ක වටිනාකම ගණනය කර මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි.

(ඒ) 2016 වර්ෂයේ හා 2017 වර්ෂයේ මිලදී ගෙන තිබූ රු.1,404,525 ක් වටිනා යන්ත්‍ර හා උපකරණ, ශේෂපත්‍රයේ යන්ත්‍ර උපකරණ යටතේ හා අතැති තොග යටතේ ගිණුම්ගත කිරීම නිසා අතැති තොග එම වටිනාකමෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඔ) සභාව වෙත නිත්‍යානුකූල ඔප්පු මගින් පවරා දෙන ලද පොළොන්නරුව රවුම් පාරේ පිහිටි රූඩ් 02 පර්චස් 9.54 කඉඩමේ වටිනාකම හඳුනාගෙන ගිණුම් ගතකර නොතිබුණි.

(ඕ) පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා 2017 වර්ෂයේදී ලබා දි තිබුණු MAJIC BLOKUN හා CIRCUIATION BURNNER යන්ත්‍ර දෙකේ වටිනාකම හඳුනාගෙන ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

1.3.2 නොසැඳුණු ගිණුම්
----------------------

(අ) සමාලෝචිත වර්ෂයේ ගිණුම් විෂයයන් 03 ක මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් හා ඊට අදාල උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු. 9,664,773 ක නොසැසඳීම් පැවතුණි.

(ආ) ස්ථාවර වත්කම් ගිණුමේ වටිනාකම ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුමට සමාන විය යුතු වුවත්, එම ගිණුම් දෙක අතර රු.152,135,811 ක වෙනසක් පැවතුණි.

1.3.3 ලැබිය යුතු ගිණුම්
------------------

සමාලෝචිත වර්ෂය අවසානයට මුල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු ගිණුම් ශේෂ ලෙස දක්වා තිබුණු අයකිරීමට තිබෙන වැඩ සඳහා රු. 2,699,837 ක් වර්ෂ 15 කට අධික කාලයක සිට කිරීමට හා වැටුප් ප්‍රතිපූර්ණය සඳහා වූ රු. 1,715,017 ක් 2014 වර්ෂයේ සිට නිරවුල් නොකර පැවතුණි.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම
------------------------------------

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 490,902,154 ක් වූ ගිණුම් විෂයයන් 6 ක් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය..

1.3.5 අනුකූල නොවීම්
-------------------

1.3.5.1 නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට හා අනුකූල නොවීම්
-------------------------------------------------------------------------

නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ වලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | |
| (i) | 154 වැනි වගන්තිය | සභා බල ප්‍රදේශයේ පැවති ඉඩම් වෙන්දේසියකින් අයවිය යුතු සියයට 1 බද්ද අයකර ගෙන නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | 1984 අංක 37 දරන(සංශෝධිත) විනෝද බදු ආඥා පනත<br>-------------------------------------------- | සභා බල ප්‍රදේශය තුල පිහිටි සිනමා ශාලාවෙන් අයකළ යුතු විනෝද බදු සමාලෝචිත වර්ෂයේදීත් අයකර නොතිබුණි. |
| (ඇ) | 1988 අංක 56 දරන ජාතික පාරිසරික පනත | සභාවට පැවරී ඇති බලතල අනුව ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ කල් ඉකුත් වී තිබුණු පරිසර ආරක්ෂණ බලපත්‍ර 25 ක් සම්බන්ධයෙන් 2017 නොවැම්බර් 28 දින වනවිටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (ඇ) | 1988 ප්‍රාදේශීය සභා (මුල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහය | |
| (i) | රීති අංක 59 සිට 63 | සභා බල ප්‍රදේශය තුළ සමීක්ෂණයක් පවත්වා කර්මාන්ත සහ වෙළඳ ව්‍යාපාර පිළිබඳ ලැයිස්තුවක් පිළියෙල කර නොතිබුණි. |
| (ii) | 193 රීතිය | එක් එක් ආදායම් විෂයය යටතේ වන අතිරික්තය හෝ ඌණතාවය සහ එක් එක් වැය විෂයය යටතේ වන අතිරික්තයන් හා ඉතිරිකිරීම් පිලිබඳ කරුණු පැහැදිලි කරන ප්‍රකාශයක් සමාලෝචිත වර්ෂය සඳහා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (iii) | 203 රීතිය | 2018 අප්‍රේල් වන විටත් 2017 වර්ෂය සඳහා දේපල හා භාණ්ඩ පිළිබඳ සමීක්ෂණයක් සිදුකර නොතිබු අතර, 2016 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2018 ජනවාරි 19 දින සභාව වෙත ඉදිරිපත් කර තිබුණි. |
| (ඉ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) | මු.රෙ 396 | ගෙවීම් සඳහා ඉදිරිපත් නොකල, මාස 06 ඉකුත් වූ රු. 326,945 ක් වටිනා චෙක්පත් 10 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ii) | මු.රෙ 880 | ඇප තැබිය යුතු නිලධාරීන් 10 දෙනෙකුගෙන් ඇප ලබාගෙන නොතිබුණි. |
| (ඊ) | චක්‍රලේඛ හා ලිපි | |
| | 2015 දෙසැම්බර් 04 දිනැති අංක එන්සිපී./එල්ජී/ඒසී/04/01/02 දරන පළාත් පාලන කොමසාරිස් චක්‍රලේඛය | අනුමත උපරිම ඉන්ධන සීමාව ඉක්මවා සමාලෝචිත වර්ෂයේ මාර්තු සිට මැයි දක්වා සභාවේ ලේකම් විසින් ඉන්ධන ලීටර් 545 ක් සඳහා රු. 51,775 ක් වැය කර තිබුණි. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමඉක්ම වූ ආදායමරු. 26,015,619 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.24,976,586 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම, බිල්කළ ආදායම, රැස්කළ ආදායම හා හිඟ ආදායම

(i) සමාලෝචිත වර්ෂයට අදාලව හා ඉකුත් වර්ෂයට සභාව විසින් ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම, බිල්කළ ආදායම, රැස්කළ ආදායම හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2016 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ මුදල | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ මුදල | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් | 15,065,600 | 13,146,199 | 10,358,800 | 13,109,725 | 13,868,268 | 13,518,768 | 10,196,009 | 16,432,485 |
| (ii) | කුලී | 17,195,045 | 13,856,554 | 14,166,659 | 696,361 | 17,268,549 | 15,610,263 | 15,493,020 | 813,604 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 5,180,100 | 5,145,689 | - | 18,847,685 | 6,000,000 | 9,204,257 | 750,310 | 27,301,632 |
| (iv) | වෙනත් | 8,270,300 | 12,077,607 | 8,729,751 | 11,137,939 | 12,000,000 | 11,424,367 | 20,143,075 | 2,419,231 |
| | | 45,711,045 | 44,226,049 | 33,255,210 | 43,791,710 | 49,136,817 | 99,757,655 | 46,582,414 | 46,966,952 |

#### 2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සභාවේ ඇස්තමේන්තුගත ආදායම රු. 45,711,045 ක්, බිල්කල ආදායම රු. 44,226,049 ක් හා රැස්කර තිබූ ආදායම රු. 33,255,210 ක් විය. වර්ෂය අවසානයට හිඟ ආදායම රු. 43,791,710 ක් වූ අතර එය බිල්කල ආදායම අනුව සියයට 99 ක මට්ටමක පැවතුණි.

#### 2.3.3 වරිපනම් හා බදු

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) හිඟ හිටි වරිපනම් බදු සම්බන්ධයෙන් රතු නිවේදන 160 ක් ලියා ආදායම් පරීක්ෂකයන් වෙත භාරදී තිබුණද වූ 2017 නොවැම්බර් 29 දින වන විටත්රතු නිවේදන 43 ක් පමණක් බෙදාහැර තිබුණි.මේ සම්බන්ධයෙන් ආදායම් පරීක්ෂකවරුන්දක්වන දායකත්වය අවම මට්ටමක පවතින බව නිරීක්ෂණය විය.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනවලින් අයවිය යුතු රු. 1,133,432 ක වරිපනම් අයකර ගැනීමට ප්‍රමාණවත් අවධානයක් යොමුකර නොතිබුණි.

(ඇ) 2017 වර්ෂයේ පැවති සැලසුම් කමිටුව විසින් අනුමත කරන ලද වරිපනම් බදු අය කරන ප්‍රදේශවල නව ඉදිකිරීම් 19 ක් සඳහා බදු අයකර නොතිබුණි.

(ඈ) 2017 වර්ෂයේ 31 දිනට අයවිය යුතු හිඟ වරිපනම් හා බදු රු. 12,263,275 ක් වූ අතර එය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 42 කින් වර්ධනයවී තිබුණි.

2.3.4 කුලී

---------

(අ) පළාත් පාලන කොමසාරිස්ගේ 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන චක්‍රලේඛයේ 02 ඡේදය ප්‍රකාරව වර්ෂ 05 කට වරක්වත් තක්සේරුගත බදු කුලිය සංශෝධනය කළ යුතු වුවත්, සභාව සතු කඩ කාමර සංකීර්ණ 05 ක වර්ෂ 08 කට පෙර තක්සේරුවපදනම් කරගෙන කුලි අය කරමින් පැවතුණි.

(ආ) සභාව සතු කඩ කාමර 25 ක්වලංගු ගිවිසුම් නොමැතිව බදු දී තිබුණි.

(ඇ) කදුරුවෙල බස් නැවතුම්පලෙිහිසභාව සතු කඩ කාමර 118 කින් හිග හිටි කුලිය රු. 948,850 ක් වු අතර, ඉන් කඩ කාමර 6 කින් වර්ෂ දෙකකට අධික කාලයක සිය පවතින හිඟ හිටිකුලීරු. 202,575 ක්අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ඈ) පොළොන්නරුව පොළ භූමියේ නව දෙමහල් කඩ කාමර ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා පැරණි කඩ කාමර කඩා ඉවත් කිරීමේදී කඩ හිමියන් 24 දෙනෙකුගෙන් අයවිය යුතුව තිබූ රු. 81,250 ක කුලී වර්ෂ 4 කට අධික කාලයක් ගතවී තිබුණ ද අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.

(ඉ) කදුරුවෙල බස් නැවතුම්පලෙිහිසභාව සතු කඩ කාමර වල එක්වන මුදල් (key Money) අදාල ගිවිසුම් අනුව 2004 වර්ෂයේ සිට අවුරුදු 04 ක් ඇතුලත ගෙවා අවසන් කළ යුතු වුවද, කඩ කාමර 23 කින් අයවිය යුතු රු.1,111,674 ක් 2017 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණි.

2.3.5 වෙනත් ආදායම්

-----------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය ප්‍රකාරව සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි හෝටල් 06 කආදායමෙන් සීයයට 1 නොඉක්මවන පරිදි ගාස්තුවක් 2017 නොවැම්බර් 28 දින වනවටිත් අයකරගෙන නොතිබුණි.

(ආ) 2017 වර්ෂය සඳහා කසල බදු අය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සභා බල ප්‍රදේශයේ පවත්නා ත්‍රීරෝද රථ ගාල් වලින් ගාස්තු අය කිරීමඅ සඳහා අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි.

(ඈ) 2017 දෙසැම්බර් 31 දිනට මුළු ජල ගාස්තු හිඟය රු. 300,188 ක් වූ අතර, එම මුදල අයකර ගැනීමට ප්‍රමාණවත් අවධානය යොමුකර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය අවසානයට සභාවට අයවිය යුතු කසළ බදුරු. 3,111,000 ක් වූ අතර, ඒ තුල රු. 50,000 ඉක්ම වූ හිඟ කසල බදු නොගෙවූ ආයතන 17 ක් විය. මෙම හිඟ බදු අයකර ගැනීම සම්බන්ධයෙන් සභාව ප්‍රමාණවත් අවධානය යොමුකර නොතිබුණි.

2.3.6 උසාවි දඩ

-------------

(අ) පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් 2017 සැප්තැම්බර් 30 දිනටලැබිය යුතුව තිබූඋසාවි දඩරු. 2,419,232 කවූ අතර 2017 ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා ලැබිය යුතු උසාවි දඩ මුදල හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**-------------------------**

3.1 කාර්ය සාධනය

------------------

ප්‍රාදේශීය සභා පනතේ 03 වගන්තිය යටතේ මහජන සෞඛ්‍යය, පොදු උපයෝගීතා සේවාවන්ට සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනයකිරීම ජනතාවගේ සුඛ විහරණය, පහසුව සහ සුභසාධනය යන සභාව විසින් ඉටුකල යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම,පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

-------------------

ප්‍රාදේශීය පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා ඉටු කිරීම සඳහා අවශ්‍ය අතුරු ව්‍යවස්ථා ප්‍රමාණය හඳුනාගෙන නොතිබූ අතර 2017 දෙසැම්බර් 31 දින විටත් කාරණා 42 ක් වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා වැළඳගෙන තිබුණ නමුත් සම්මත අතුරු ව්‍යවස්ථා අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) ක්‍රියාකාරී සැලැස්ම

----------------------

පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටුකළ යුතුවතිබුණු කර්තව්‍යයන් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

----------------------------------

ගල්ලැල්ල කසළ අපහරණ මධ්‍යස්ථානයේ දෛනික කසළ අපහරණ කටයුතු සඳහා ප්‍රමාණවත් සේවක සංඛ්‍යාවක් නොමැතිවීම, සේවකයින් සඳහා ප්‍රමාණවත් සුභ සාධන පහසුකම් සලසා නොමැතිවීම, අවශ්‍ය ගොඩනැඟිලි පහසුකම් නොමැතිවීම වැනි අඩුපාඩුදක්නට ලැබුණි.

(ඈ) පාරිසරික ගැටළු

-------------------

ප්‍රාදේශීය සභාව සතුව අපජල පිරිපහදු පද්ධතියක් නොතිබීම නිසා සභා බල ප්‍රදේශයේ පවතින ව්‍යාපාරික හා රාජ්‍ය ආයතනවල මල හා අපවහන ජලය සහ කදුරුවෙල මාළු වෙළඳසැලෙහි අපද්‍රව්‍ය ගලි බවුසරය මඟින් ගල්ලැල්ල අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය පිහිටි භූමියට ආසන්න කැලයට බැහැර කරන බව නිරීක්ෂණය වූ අතර මෙය පාරිසරික මෙන්ම සෞඛ්‍ය ගැටළු වලට හේතුවී තිබුණි.

(ඉ) තිරසර සංවර්ධන ඉලක්ක

-------------------------------

එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ප්‍රකාශිත තිරසර සංවර්ධන අරමුණු පිළිබඳව සභාව දැනුවත් වී නොතිබුණු බැවින් සභාවට අදාල අරමුණු, ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන, ඒ සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය හා අනෙකුත් සම්බන්ධිත රාජ්‍ය ආයතන පිළිබඳව හඳුනාගෙන නොතිබුණි.

3.2 කළමනාකරණ ආකාර්යක්ෂමතා

--------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව විසින් සමාලෝචිත වර්ෂයේ දී ආදායම් විෂයයන් 05 කින් රු. 5,854,250 ක ආදායම් රැස්කර තිබුණද ඒ සඳහා අතුරු ව්‍යවස්ථා සම්මත කරගෙන නොතිබුණි.

(ආ) පොළොන්නරුව නව වෙළඳ සංකීර්ණයේ ඉදිකිරීම් ව්‍යාපෘතිය සඳහා උපදේශන සේවා සැපයීම වෙනුවෙන් තෝරාගත් ආයතනය සමඟ ගිවිසුමකට එළඹ නොතිබුණි. ඉදිකිරීම් ව්‍යාපෘතිය නිම වීමට පෙර උපදේශන ආයතනය උපදේශන සේවා සැපයීමෙන් ඉවත් වී තිබුණු අතර එම ආයතනයෙන් ලබාදිය යුතු සැලසුම්පත් හා කළ වැඩ පිළිබඳ අධීක්ෂණයක් නොවීම් මත ඉදිකිරීම් ප්‍රමාද වී තිබුණි.

(ඇ) උතුරු නැඟෙනහිර පළාත් පාලන සේවා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ ඉසිපතන ළමා උද්‍යානය ඉදිකිරීම සඳහා රු. 21,221,593 ක් හා උතුරු මැද පළාත් සභා අරමුදලින් ක්‍රීඩා උපකරණ(Play Item)සඳහා රු. 4,000,000 ක්, වැයකර 2017 පෙබරවාරි 17 දින වැඩ අවසන් කර තිබූ ළමා උද්‍යානය 2018 අප්‍රේල් 10 දින වනවිට වසරක කාලයක් ඉක්ම ගොස් තිබුණද එය මහජනයාගේ පරිහරණය සඳහා ලබාදී නොතිබුණි.

(ඈ) 2017 නොවැම්බර් 21 දින සිට 2018 අප්‍රේල් 09 දින දක්වා සභාවේ වීථි ලාම්පු අංශයට ලැබී තිබුණු පැමිණිලි 73 ක් සම්බන්ධයෙන් නිලධාරීන් කටයුතු කර නොතිබුණි.

(ඉ) සභාවේ හිටපු සභිකයන් දෙදෙනෙකුගෙන් වර්ෂ 03කට වැඩි කාලයක සිට අයවීමට ඇති රු. 14.000 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.3 මානව සම්පත් කළමනාකරණය

------------------------------------

(අ) 2017 දෙසැම්බර් 31 දිනට විට වර්ෂ 01 සිට 7 දක්වා කාලයක සිට අය නොවී පවතින සේවක ණය ශේෂය වූ රු. 163,415 ක අයකර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ තෘතියික මට්ටමේ නිලධාරීන් 02ක්, ද්විතියික මට්ටමේ නිලධාරීන් 25 ක්, හා ප්‍රාථමික මට්ටමේ සේවකයින් 17 ක් පුරප්පාඩුව පැවති අතර ද්විතියික හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 2 ක අතිරික්තතා පැවතුණි. ඊට අමතරව අනුමත නොවූ තනතුරු සඳහා පුද්ගලයින් 04 දෙනෙකු සේවයේ යොදවා වැටුප් ගෙවා තිබුණි.

3.4 මෙහෙයුම් ආකාර්යක්ෂමතා

----------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව විසින් කුලියට දෙනු ලබන බුද්ධි මණ්ඩපය, බැඳිවැව ලීලාරත්න විජේසිංහ ශ්‍රවනාගාරය හා රජරට නවෝදය ක්‍රීඩාංගනය යන ස්ථාන වල පැවති වැඩසටහන් පිළිබඳව එම ස්ථානයේ භාරකරුවන් විසින් ලේඛන නඩත්තු කර නොතිබුණු අතර, කාර්යාලයේ පවත්වාගෙන යන ලේඛනයක් මඟින් වෙන්කිරීම් කර තිබුණු බැවින් එම ස්ථාන කුලියට දීම පිළිබඳ තොරතුරුතහවුරු කර ගැනීමට විගණනයේදී නොහැකි විය.

(ආ) සභාව සතු ආයුර්වේද ඖෂධ ශාලා 3 හි ප්‍රතිකාර ලබාගන්නා රෝගීන් සංඛ්‍යාව 2016වර්ෂයේදී 13,367 ක් වූ නමුත් 2017 වනවිට 9,922 දක්වා අඩුවී තිබුණි. තවද ආයුර්වේද ජංගම සායන පැවැත්වීමද ඉතා දුර්වල මට්ටමක පැවතුණු අතර ඖෂධ මිලදී ගැනීම සඳහා 2017 වර්ෂයේ අයවැය මඟින් රු. 450,000 ක් වෙන්කර තිබුණද, සමාලෝචිත වර්ෂය තුලදී රු. 213,485 ක් වටිනා ඖෂධ පමණක් මිලදී ගෙන තිබුණි.

(ඇ) සිංහපුර ජල ව්‍යාපෘතියේ ජලය කිසිදු පිරිපහදු නොකර බෙදා හරිනු ලබන අතර සමාලෝචිත වර්ෂය තුල ජල පරීක්ෂණ වාර්තා ලබාගෙන නොතිබුණි.

3.5 අවිධිමත් ගණුදෙණු

----------------------

(අ) සභාව මඟින් 2017 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද රු. 25,646,542 ක ගෙවීම් වලට අදාල මාර්ග සංවර්ධන ව්‍යාපෘති 14 ක් සඳහා යොදන ලද අන්තර්බන්ධිත ගල් සම්බන්ධයෙන් තත්ත්ව පාලන වාර්තා කොන්ත්‍රාත්කරු විසින්ම ඉදිරිපත් කර තිබුණි.

(ආ) සභාව මඟින් නවනගරය සතිපොළ බදු දී තිබුණ ද 2017 වර්ෂයට අදාල ජල හා විදුලි වියදම් රු. 35,053 ක් සභාව විසින් දරා තිබුණි.

3.6 කොන්ත්‍රාක් පාලනය

-------------------------

2013 දැයට කිරුළ යටතේ ලැබුණු රු.මිලියන 20 ක් හා සභා අරමුදලින් රු. 713,365 ක් වැයකර තමන්කඩුව ප්‍රාදේශීය සභා සතිපොළ භූමියේ ඉදිකරන ලද කඩ කාමර 44 හි වැඩ 2014 දෙසැම්බර් 22 දින වනවිට අවසන්කර තිබුණි. 2018 අප්‍රේල් වනවිට ගොඩනැගිල්ල ඉදිකර වර්ෂ 3 ½කට ආසන්න කාලයක් ගත වී තිබුණ ද, එය භාවිතයට නොගෙන නිශ්කාර්යව තිබීම නිසා ගොඩනැගිල්ල දැඩි ලෙස විනාශ වීමකට ලක්වීතිබුණි. මෙම වෙළඳ සංකීර්ණයේ බිත්තියට සවිවන ඉහල මාලයේ සියළු තලාද (බීම්) අතරින් ජලය කාන්දුවීම, ස්ථාන කිහිපයක බිත්ති ඉරිතලා තිබීම, කඩ කාමරවල හකුලන දොරවල දොර රාමුවට (සවිකර ඇති ආධාරක) මලබැඳ දිරාපත් වි තිබීම, පහල මාලයේ සවිකර ඇති Sport Light 9 ක් නැවත භාවිතයට ගත නොහැකි ලෙස දිරාපත් වී තිබීම හා රු. 3,280,752 ක් වැයකර සවිකරන ලද හකුලන දොරක රැඳවුම්පෙට්ටිය භාවිතා කිරීමටත් පෙර සම්පූර්ණයෙන් ගැලවී තිබීම යන අඩුපාඩු නිරීක්ෂණය වූ නමුත් 2015 ජනවාරි 01 දින රු. 452,777 ක් වූ අත රැඳවුම් මුදල් කොන්ත්‍රාත්කරු වෙත සම්පූර්ණයෙන්ම නිදහස් කර තිබුණි.

3.7 හඳුනාගත් පාඩු

------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව විසින් පොල භූමියේ ඉදිකර බදු දී තිබුණු පැරණි කඩ කාමර 2013 වර්ෂයේ කඩා ඉවත් කිරීමේදී කඩහිමියන් 13 දෙනෙකුගෙන් විදුලි බල මණ්ඩලයට ගෙවීමට තිබුණු රු. 33,847 ක් වූ හිඟ විදුලි ගාස්තු සභාව විසින් දරා තිබුණු අතර වර්ෂ 04 ක ආසන්න කාලයක් ගතවී තිබුණ ද, එම මුදල් අයකර ගෙන නොතිබුණි

(ආ) සභාව සතු ඉසිපතන අංක 01 දරන නිල නිවසේ 2017 ජනවාරි 01 දින සිට පදිංචි වී සිටි ලේකම්වරියගෙන් ඒ සඳහා ආයතන සංග්‍රහයේ විධි විධාන ප්‍රකාරව අයකල යුතු කුලිය අයකරගෙන නොතිබුණු අතර ලිඛිත ගිවිසුමකටද එළඹ නොතිබුණි.

(ඇ) ආයතන සංග්‍රහයේ xix වැනි පරිච්ඡේදයේ 5.4 ඡේදය ප්‍රකාරව රජයේ නිවාසයක පදිංචි වූ අවස්ථාවක වැටුපෙන් සියයට 12.5 ක් අයකල යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ නිලධාරීන් දෙදෙනෙකුගෙන් රු. 19,131 ක් අඩුවෙන් අයකර තිබුණි.

(ඈ) පොළොන්නරුව නාගරික උද්‍යානය ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යංශය මඟින් රු. මිලියන 5 ක ප්‍රතිපාදන ලබාදීමට අනුමැතිය ලැබීම නිසා මූලික පාරිසරික වාර්තාවක් ලබාගැනීමට වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට රු. 50,000 ක්, සැලැස්මක් (අනුරේඛනයක්) ලබාගැනීම සඳහා මිනින්දෝරු දෙපාර්තමේන්තුවටරු. 16,800 ක් හා මූලික පාරිසරික වාර්තාව සැකසීම සඳහා ගොඩනැගිලි පර්යේෂණ ආයතනයට රු. 855,000 ක් 2010 - 2012 කාල පරිච්ඡේදය තුල වැයකර තිබුණද, අදාල ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකිරීම මත එම වියදම් නිශ්කාර්යවී තිබුණි.

3.8 වාහන උපයෝජනය

-------------------------

සභාව සතු වාහන සම්බන්ධයෙන් වාහන ලොග් පොත් යාවත්කාලීන කර නොතිබුණි.

**4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය**

**-------------------------------------**

4.1 අභ්‍යන්තර විගණනය

----------------------

සමාලෝචිත වර්ෂය සඳහා සභාව විසින් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

4.2 විගණන හා කළමනාකරණ කමිටු

---------------------------------------

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයන්හි විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා කාලානුරූපිව රැස්වීම් පවත්වා නොතිබුණි.

**5. පද්ධති හා පාලන**

**-----------------**

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින් වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන්කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් | (i) | ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීනව නොපැවැත්වීම |
| | | (ii) | වත්කම් ඌන උපයෝජිතව පැවැතීම |
| (ආ) | ආදායම් පරිපාලනය | (i) | හිඟ ආදායම් අය නොකිරීම |
| | | (ii) | බදු ගිවිසුම් විධිමත් නොවීම |
| | | (iii) | මුදල් රැස්කිරීම හා ගිණුම්ගත කිරීම යාවත්කාලීන නොවීම |
| (ඇ) | ණයගැති/ණයහිමි පාලනය | (i) | නිවැරදිව ගිණුම්ගත නොකිරීම |
| | | (ii) | ණයගැතියන් හා ණයහිමියන් නිරවුල් නොකිරීම |
| (ඈ) | අභ්‍යන්තර පාලනය | (i) | අභ්‍යන්තර විගණනයක් සිදු නොකිරීම |
| | | (ii) | විගණන හා කළමනාකරණ කමිටු නොපැවැත්වීම |

.